# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2332/25 – 2023 මැයි 18 වැනි බ්‍රහස්පතින්දා – 2023.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය*: IR/COM/01/2021/81.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2318/36 දරන හා 2023.02.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් කැළණිය, වේවැල්දූව, මහවත්ත පාර, අංක 125/ 5 හි පදිංචි නන්දන සෙනරත් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කැළණිය, වෙදමුල්ල, නුවර පාර, අංක 933 හි පිහිටි ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A45/2022 දරන හා 2022.12.15 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් නන්දන සෙනරත් මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A45/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2024.02.09 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 03 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 039513 – 11 (2023/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

පළමුවන උපලේඛනය

"අ" ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය : නන්දන සෙනරත්, අංක 125/5, මහවත්ත, වේවැල්දූව- කැළණිය.
දිනය : 2023.04.21

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2023.02.09 දිනැති අංක 2318/ 36 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද නන්දන සෙනරත් සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව බැඳී සිටින්නාවූ ද 2022.12.15 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතිකෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පිටපත : (අනෙක් පාර්ශ්වය)
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.

1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සැම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න)

2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවා යෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වාත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන්ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කල යුතුය.

EOG 05- 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.